නිකොලායි නෝසව්

පත්‍ර ඇති තොප්පිය



නිකොලායි නෝසව්

පිණ ඇති කොප්පිය

චිත්‍ර - ඉවාන් සිමියෝනව්

අනුවාදය - දැදිගම වී. රුද්රිගු

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස

91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

පූස් පැටියෙක් ලාච්චු මේසයළඟට වෙලා මැස්සන් අල්ලමින් හිටියා. ලාච්චු මේසෙ එක් කොණක තොප්පියක් තිබුණා. ඔය තොප්පිය උඩ මැස්සෙක් වහල හිටියා. මැස්සව අල්ලගන්න පූස් පැටියා උඩ පැන්නා. එතකොට තොප්පිය උගෙ ඔළුවෙ පැටලිලා ඌත් එක්ක බිම වැටුණා. දැන් පූස් පැටියා තොප්පිය ඇතුළෙ.



කාමරය ඇතුළෙ පින්තූර පාට කරමින් හිටිය වලෝද්යායි, වාදිකුයි පූස් පැටියා තොප්පිය ඇතුළට අසු වුණ හැටි දැක්කේ නැහැ. මොකක්දෝ බිම වැටුණු හඬ විතරයි ඒ ගොල්ලන්ට ඇහුණේ.

ලාච්චු මේසය ළඟ බිම වැටිල තියෙන තොප්පිය වලෝද්යා දැක්කා. වලෝද්යා තොප්පිය අරගෙන මේසෙ උඩින් තියන්න පාත් වුණා විතරයි කෑ ගැහුවා.

"අපොයි!"

"වලෝද්යා, මොකද?" කියල වාදික් ඇහුවා.
"මෙන්න පණ ඇති තොප්පියක්."
"මොකක් ද කීවේ?"

"පණ ඇති තොප්පියක්!"
"වලෝද්යාට පිස්සු. පණ ඇති තොප්පි තියෙනව ද?"
"හොඳයි, ඇවිත් බලන්නකො!"



වාදික් තොප්පිය ළඟට ඇවිත් හොඳ හැටි බැලුවා. මෙන්න හිටි හැටියෙ ම තොප්පිය වාදික් ළඟට එනවා. වාදික් මහ හයියෙන් කෑ ගැහුවා. "අපෝ!" එයා ඉක්මනට ම සැටිය උඩට පැන ගත්තා. වලෝද්දයා ත් සැටිය උඩට නැංගා.



තොප්පිය කාමරය මැදට ඇවිල්ල්ලා නැවතුණා. ළමයි දෙදෙනා ම හොඳට ම බය වෙලා බලාගෙන ඉන්නවා.

එතකොට තොප්පිය සැටිය දිහාට යන්න පටන් ගත්තා.

"අපොයි! අපොයි!" කියල ළමයි දෙදෙනා කෑගහන්න පටන් ගත්තා.



දෙදෙනා ම සැටියෙන් පැනලා කාමරයෙන් එළියට දිව්වා. කුස්සියට දුවගෙන ඇවිල්ලා දොර වසා ගත්තා.

"මේක හරි පුදුම තොප්පියක් නෙව? මොකක් ද ඔය තොප්පිය කාමරේ ඇතුළෙ බඩ ගාන්නේ?" කියල වාදික් ඇහුවා.

"තොප්පිය ලණුවකින් බැඳල කවුරු හරි අදිනව ඇති, ආ?"

"ගිහිං බලන්න."

"දෙන්න ම යමු. මම යකඩ පොල්ල අරගන්නම්. අපේ ළඟට ආවොත් මම තොප්පියට යකඩ පොල්ලෙන් ගහන්නම්."

"නවතින්න, මමත් යකඩ පොල්ලක් ගන්නම්."

"අපේ ගෙදර තියෙන්නෙ එක යකඩ පොල්ලයි."

"මම කොහු මිට අරගන්නම්."

යකඩ පොල්ල යි, කොහු මිට යි අරගෙන දෙදෙනා ම කාමරය ඇතුළට ගියා.

"තොප්පිය කොහෙ ද?" කියල වලෝද්යා අහනව.

"මෙන්න මේසෙ ළඟ."





තොප්පිය මේසෙ ළඟට වෙලා හෙලවෙන්නෙ නැතුව ඉන්නවා.

"මෙන්න එයා බය වෙලා, අප ළඟට එන්න බය වෙලා." ළමයි දෙන්නා සන්තෝෂ වුණා.

"මම දැන් එයාව බය කරන්නම්," කියල වලෝද්යා කීවා. යකඩ පොල්ලෙන් බිමට තට්ටු කරල එයා කෑගැහුවා:

"ඒයි, පණ ඇති තොප්පිය!"

ඒ වුණාට තොප්පිය හෙලවුණේ නැහැ.

"අපි ගිහිං අල ගෙඩි ගෙනැල්ලා ඒවාවලින් තොප්පියට ගහමු" කියල වාදික් කීවා.

කුස්සියෙන් අල ගෙඩි කීපයක් ගෙනැල්ලා තොප්පියට ගහන්ට පටන් ගත්තා. වාදික් ගහපු අලයක් තොප්පිට වැදුණා. තොප්පිය උඩ පැනලා කෑගැහුවා.

"ඇදාව්!"

තොප්පිය යටින් අළු පාට වලිගයක් එළියට ආවා.

"ඒ අපේ පූස් පැටියා" කියල දෙදෙනාම කීවා.

වාදික් පූස් පැටියා වඩා ගත්තා.

"අනේ පූස් පැටියා. ඌ කොහොම ද තොප්පිය යටට රිංග ගත්තේ?"

පූස් පැටියා පිළිතුරු දුන්නේ නෑ. ඌ මුරු මුරු ගෑවා විතරයි.



නිකොලායි නෝසව්

පණ ඇති තොප්පිය



ISBN 978-955-1319-54-0

LKR 150/-

9 789551 319540

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස

91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08